පුවත්පතක පළවන සෑම අන්තර්ගතයක්ම මාධ්‍ය ආචාර ධාර්මික පෙරහනක් තුළින් පැමිණිය යුතු යැයි පිළිගැනෙන්නේ, ජනමතය හැඩගැස්වීමට මාධ්‍ය වෙත ඇති හැකියාව නිසාම වේ. කෙසේ වෙතත් ඇතැම් විටක මාධ්‍ය මෙම පිළිවෙතින් පිට පනිනා අවස්ථාවන්ද දක්නට ලැබේ.

අගෝස්තු 23 දින දිවයින කතුවැකිය තුළ "වඳ දොස්තර ෂාෆි..." යනුවෙන් වූ සඳහනක් දක්නට ලැබිණි. මෙවන් චෝදනාවකට නීතිය මගින් තවමත් වෛද්‍ය ෂාෆි වරදකරුවෙකු කොට නැති පසුබිමකදී, දිවයින පුවත්පත මගින් ඔහුව වරදකරුවෙකු ලෙසින් පෙන්වන්නේ කුමන පදනමකින්ද?

එසේම නීතිය ඉදිරියේ සැකකරුවෙකු වන ශානි අබේසේකර සහ තවත් පොලිස් නිලධාරීන් කිහිප දෙනෙකු හට පුද්ගලික ප්‍රහාරයන් කතුවැකියක් ඔස්සේ එල්ල කිරීම කෙතරම් සදාචාරාත්මක වේද?

#MediaEthicsSL #lka #SinhalaPress #SundayDivaina